පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව
----------------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 11 ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 19 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 14 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වාහන කුලී ආදායම් ලේඛනයට අනුව 2016 වර්ෂයේ දී ලද ආදායම රු. 2,350,001 ක් වුවද, එය රු. 2,280,555 ක් ලෙස ආදායම් වියදම් ගිණුමට ඇතුලත් කර තිබීමෙන් ආදායම රු. 69,446 ක් අඩුවෙන් දක්වා තිබිණි.

(ආ) රාජ්‍ය නොවන සංවිධානයක් විසින් 2015 වර්ෂයේ දී ප්‍රාදේශීය සභාවට පවරාදුන් රු. 4,385,000 ක් වටිනා බස් රථය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සභාව සතුව පවතින ට්‍රැක්ටර් රථ දෙකක හා යතුරුපැදියක වටිනාකම් තක්සේරු කොට ප්‍රාග්ධනිත කර නොතිබුණි.

1.3.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්.
--------------------------------------------------

ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති අංක 217 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,598,815 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,630,456 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලය රු.5,968,359 කින් වැඩි වී තිබුණි.

පසුගිය වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් සහ සේවා ගාස්තු රු.5,000,000 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 5,968,359 කින් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 මූල්‍ය පාලනය

-----------------

1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති අංක 185 ට අනුව සභාවේ මුදල් එදිනෙදා අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි යැයි සලකණු ලැබේ නම්, සභාවේ එකඟතාවය ඇතිව ස්ථිර තැන්පතු වශයෙන් බැංකුවක තැන්පත් කල යුතු වුවද, සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙහි 2016 වර්ෂයෙහි සෑම මාසයක් අවසානයේ දීම රු. ලක්ෂ 41 ත් ලක්ෂ 85 ත් අතර මුදලක් පැවති අතර, මෙම අතිරික්ත මුදල් ස්ථිර තැන්පතුවක ආයෝජනය කර ආදායම් උපයා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

--------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

---------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | 2016 වර්ෂය | | |
| | රු..000 | රු.000 | රු.000 |
| බදු කුලී | 1,062 | 1,109 | 123 |
| බලපත්‍ර ගාස්තු | 349 | 289 | 15 |
| වෙනත් ආදායම් | 8,461 | 12,379 | 3,500 |

(ආ) සභා බල ප්‍රදේශය තුල සන්නිවේදන කුළුණු පවත්වා ගෙන යාම වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා අදාල ආයතන වලින් ගාස්තුවක් අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාවට උපයාගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරික්ෂණය කෙරේ.

(අ) වටිනාකම රු. 102,683,386 ක් වූ ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල ප්‍රවාහන පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ පළාත් පාලන අමාත්‍යාංශය මගින් සභාවට ලබාදුන් වාහන 03 කට අදාලව අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන 2016 යටතේ වීදි ලාම්පු උපාංග 30 ක් ලබා ගැනීම වෙනුවෙන් 2017 වර්ෂයේ ජනවාරි මාසයේ රු. 99,065 ක මුදලක් වැය කොට තිබූ නමුත් එයින් එකක් පමණක් සවිකොට තිබුණු අතර, ඉතිරි වීදි ලාම්පු 2017 ජූනි 30 දින වන විටද සභාවේ ගබඩාවේ නිෂ්කාර්යව තිබුණි.

(ඈ) ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් නොමැති මෙම ප්‍රාදේශීය සභාවට වෛද්‍යවරයෙක් අනුයුක්ත කර තිබීම නිසා මෙම වෛද්‍යවරයාගෙන් ඵලදායී සේවයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය මගින් ප්‍රජා සහභාගිත්වයෙන් බට එළීම සඳහා ප්‍රාදේශීය සභාවට 2012 සහ 2013 වර්ෂයන් වලදී ලබා දී තිබූ UPVC බට සහ සවිකිරීම් වලින් ඉතිරි වී තිබූ 3000 ක පමණ බට තොගයෙහි වටිනාකම ආසන්න වශයෙන් රු. 1,200,000 ක් පමණ වූ අතර, ඒවා ජයන්ති වැව සහ සමන්පුර යන ගබඩාවල අවිධිමත් ලෙස ගබඩා කර තිබුණි. එම බට තොගය වෙනත් කාර්යයක් සඳහා භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

3.3.1 පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ජයන්තිවැව සතිපොල ඉදිකිරීම - රු. 7,682,087

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරික්ෂණය කෙරේ.

(අ) පළමු කොන්ත්‍රාත්කරු විසින් වැඩ ආරම්භ නොකිරීම නිසා එම කොන්ත්‍රාත්තුව දෙවන කොන්ත්‍රාත්කරුට රු. 8,428,900 ක වටිනාකමට 2014 ජනවාරි 20 දින ලබා දී තිබුණි. මේ හේතුවෙන් රජයට දරන්නට සිදු වූ පාඩුව වන රු. 746,803 ක මුදල පළමු කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට තීරණය කලද රු. 384,105 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ආ) ගිවිසුමට අනුව දෙවන කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව 2014 අප්‍රේල් 19 දින අවසන් කල යුතු වුවද, වැඩ අවසන් කර සභාවට භාරදී තිබුණේ 2014 ඔක්තෝබර් 20 දින වූ අතර, ගිවිසුමේ කොන්දේසි අංක 6.4 ප්‍රකාරව අයකල යුතු ප්‍රමාද ගාස්තුව රු. 771,244 මුදල අයකිරීමට 2017 ජූනි 29 දින වන විටද කටයුතු කර නොතිබුණි.

3.3.2 පදිවි ශ්‍රී පුර ටෙලිකොම් පාර කොන්ක්‍රීට් කිරීම

---------------------------------------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන 2016 යටතේ පදිවි ශ්‍රී පුර ටෙලිකොම් පාර මීටර් 197 ක ප්‍රමාණයක් කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රු. 991,610 ක මුදලක් වැය කොට තිබුණි. මෙහි කොන්ක්‍රීට් යොදා තිබුණද, එහි දෙපස බොරළු යොදා සකස් කර නොතිබීමත් කොන්ක්‍රීට් අතරට යොදා ඇති රිජිෆෝම් ඉවත්කර තාර යොදා නොතිබීමත් නිසා මෙම මාර්ගයේ දිගුකාලීන පැවැත්මට ගැටළුවක් වී තිබිණි.

3.3.3 බොරළු යොදා මාර්ග අළුත්වැඩියා කිරීම හා ඉදිකිරීම

-----------------------------------------------------------

2015 දෙසැම්බර් 30 දිනැති මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2016/01 හි 1.2 මාර්ගෝපදේශයට පටහැනිව සභාව විසින් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ 2016 වර්ෂයේ දී මාර්ග දෙකක් රු. 271,798 කර මුදලක් වැය කර බොරළු යොදා සකස් කර තිබුණි.

3.4 පාරිසරික ගැටළු

---------------------

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුකූලව පාරිසරික හානි සිදුවන වඩු කර්මාන්ත, බ්ලොක් ගල් නිෂ්පාදන කර්මාන්ත සහ වී මෝල් ආදී ව්‍යවසායන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වුවත් සහා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන එවැනි ව්‍යවසායන් 93 ක් එම බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කර්මාන්තය කරගෙන යමින් තිබුණි.මේ සම්බන්ධයෙන් ඇති විය හැකි පාරිසරික ගැටළු නිරාකරණය කිරීමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

3.5.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

-------------------------------------------

(අ) ප්‍රාදේශීය සභාව විසින් 2015 ජනවාරි 27 වන දින රු. 485,000 ක මුදලක් වැයකර ජල සාම්පල් පරීක්ෂණ කට්ටලයක් හා ජල පෙරණ දෙකක් මිලදී ගෙන තිබුණු නමුත් එම ජල සාම්පල් පරීක්ෂා කිරීමට තාක්ෂණික දැනුමැති නිලධාරියෙකු නොමැතිවීම හේතුවෙන් එම උපකරණ කට්ටල මිලදීගත් දින සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) පළාත් පාලන හා පලාත් සභා අමාත්‍යාංශය මඟින් 2006 වර්ෂයේ සභාවට ලබා දී තිබූ කැබ් රථය 2015 වර්ෂයේ සිට ක්‍රියා විරහිතව වාහන අංගනයේ ගාල්කර තිබුණ අතර, එය අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග 2017 ජුනි 30 දින වන විටද ගෙන නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

------------------------------------

ප්‍රාදේශීය සභා ලේකම්, කළමනාකරණ සහකාර, තාක්ෂණික නිලධාරී, පුස්තකාලයාධිපති, විදුලි කාර්මික නිලධාරී සහ රියදුරු යන තනතුරුවල වර්ෂ 02 මාස 04 දක්වා කාලපරිච්ඡේදයක සිට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට 2017 ජුනි 29 දින වන විටද කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| පද්ධතිය | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | වත්කම් ගිණුම්ගත කිරීම. |
| (ආ) ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීම |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | i. චක්‍රලේඛ අනුව වැඩ ඉටු කිරීම.<br>ii. කොන්ත්‍රාත් බදු මුදල් ගෙවීම . |
| (ඈ) මානව සම්පත් කළමනාකරණය | සේවක පුරප්පාඩු පිරවීම. |